# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 2 දරන මහනුවර අසරණ සරණ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1984 ජනවාරි මැ 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය**

**මිළ : ශත 45 යි** **තැපැල් ගාස්තුව : ශත 60 යි.**

## 1984 අංක 2 දරන මහනුවර අසරණ සරණ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 42/83

**මහනුවර අසරණ සරණ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මහනුවර අසරණ සරණ සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා 1837 වර්ෂයේ හෝ තදාසන්න වර්ෂයක සිට මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ මහනුවර පිහිටුවා තිබුණු හෙයින් ද: **පූර්විකාව.**

ඒ සමිතිය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1984 අංක 2 දරන මහනුවර අසරණ සරණ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර අසරණ සරණ සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්, "මහනුවර අසරණ සරණ සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකිය. **මහනුවර අසරණ සරණ සමිතිය සංස්ථාගත කිරීම.**

**3.** සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :— **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

(අ) අයාලයේ යාම සහ හිඟමනේ යාම අධෛර්යමත් කිරීම;

(ආ) විපත් සහ අසරණබව පිළිබඳ අවස්ථා පෞද්ගලිකව ම ගොස් සොයා විමසා බලා නිශ්චය කොට දැනගැනීම සහ ආධාර දීමෙන් හෝ අන්‍යාකාරවලින් ඊට සහන සැලසීම;

(ඇ) වැඩිහිටි නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඈ) අසරණබව සහ නැති බැරිකම වැළැක්වීම හෝ ඉන් සහනය ලබාදීම හෝ සඳහා ගත හැකි වෙනත් පියවර ගැනීම;

(ඉ) ඉහත සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීමට හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම

ඒ 68457 — 7,525 (83/02)

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලු ම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිලධාරීන්ගෙන් සහ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත සභාවක් විසින් පරිපාලනය කළ යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී නිල දරන, සමිතියේ සභාව, සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතුය.

භාරකාර මණ්ඩලය.

6. (1) සංස්ථාවේ සියලු නිශ්චල දේපළවල භාරකාරත්වය, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් වෙත, සංස්ථාවේ රීතිවලට අනුකූලව, පවරනු ලැබිය යුතුය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේදී නිල දරන, සමිතියේ භාරකාර මණ්ඩලය විය යුතුය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ ඔවුන් නෙරපීම සම්බන්ධයෙන් ද, නිලධරයන්, සභාව සහ භාරකාර මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා ද, නිලධරයන්ගේ, සභාවේ, භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ යුතුකම් ඉටුකිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි වන්නේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

8. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි දී පවතින සමිතියේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සමිතියට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සහභාග මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතුය. *සමිතියෙන් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.*

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකි විය යුතු අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතුය. *සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.*

10. සභාවේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතුය. එකී සාමාජිකයන් තිදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතුය. *සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.*

11. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය. *ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි, (විදේශීය) රු. 200 යි, කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.